**Greenpeace South Asia**
6th Floor, Access Towers 1, Union Place, Col 2
www.greenpeace.org/southasia/
17th August 2026

**ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ සංරක්ෂණය හා කළමනාකරණය කිරීමේදී ආදිවාසී ජනතාවගේ සහ ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ නිදහස්, පූර්ව සහ දැනුවත් එකඟතාව (FPIC) සැලකිල්ලට ගන්නා ලෙස ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටින ලිපිය.**

ශ්‍රී ලංකා ධීවර, ජලජ හා සාගර සම්පත් අමාත්‍ය

ගරු ධීවර අමාත්‍ය

රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා

**පිටපත්:**

- පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව දෙපාර්තමේන්තුව
- සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය (MEPA)
- වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව (CC&CRMD)
- ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව (SLCG)
- ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (NARA)

ගරු මහත්මාණනි,

ජාතික ජෛව විවිධත්ව ප්‍රතිපත්තීන් තුළ, විශේෂයෙන්ම නිදහස්, පූර්ව සහ දැනුවත් එකඟතාවය (FPIC) යන සංකල්පය අර්ථවත්ව ක්‍රියාත්මක කිරීම හරහා, ආදිවාසී ජනතාවගේ සහ ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ අයිතිවාසිකම් පිළිගැනීම සහ ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කරන ලෙස අපි ශ්‍රී ලංකා ගෞරවයෙන් යුතුව අවධාරණය කර සිටින්නෙමු. 2026 ඔක්තෝබර් 19-30 දිනවල පැවැත්වෙන ජෛව විවිධත්ව සම්මුතියේ පාර්ශ්වයන්ගේ 17 වැනි සමුළුව (CBD COP17) සඳහා ලෝකය සූදානම් වෙමින් සිටින අවස්ථාවක, ආරක්ෂා කළ යුත්තේ කුමන පරිසර පද්ධති, කුමන ආකාරයට ද සහ ඒ වෙනුවෙන් සම්බන්ධ විය යුත්තේ කා සමඟද යන කරුණු මත පදනම්ව ප්‍රමුඛතා ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළුව, ජෛව විවිධත්ව සංරක්ෂණය සහ වෙරළබඩ පාලනය තුළ මානව හිමිකම් පදනම් කරගත් ප්‍රවේශයන් අන්තර්ගත කිරීම මඟින් 30x30 ඉලක්ක (2030 වන විට 30% ක ආරක්ෂාවක්) සපුරාගැනීමේ ක්‍රියාදාමය තුළ නායකත්වයක් ගැනීමට ශ්‍රී ලංකාවට වටිනා අවස්ථාවක් ලැබී තිබේ.

වනාන්තර, සාගර සහ වෙරළබඩ පරිසර පද්ධති තුළ, ආදිවාසී ජනතාව සහ ප්‍රාදේශීය ප්‍රජාවන් දැනටමත් චාරිත්‍රානුකූල පාලන ක්‍රම, සාම්ප්‍රදායික දැනුම සහ ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන සංරක්ෂණ පුරුදු හරහා ජෛව විවිධත්වය ආරක්ෂා කරමින් සිටිති. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව තවමත් දේශපාලන, නීතිමය සහ මූල්‍ය මට්ටමින් මෙම පද්ධති සහ ක්‍රමයන් ප්‍රමාණවත් ලෙස හඳුනාගෙන මෙන්ම ඒවාට සහයෝගය දක්වා නැත.

**30x30 ඉලක්ක කරා ළඟා වීම 'කොතරම් දුරට සිදු කර ඇතිද' යන්නෙන් පමණක් නොව, 'කොතරම් හොඳින් සිදු කර ඇතිද' යන්නෙන්ද තක්සේරු කළ යුතුය**

ආදිවාසී ජනතාව සහ ප්‍රාදේශීය ප්‍රජාවන් දැනටමත් ලෝකයේ වඩාත්ම ඵලදායී ජෛව විවිධත්ව ආරක්ෂකයින් සහ පරිසර පද්ධතිවල භාරකරුවන් අතර වේ. එබැවින්, අයිතිවාසිකම් මත පදනම් වූ සහ ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන සංරක්ෂණය යනු හුදෙක් ජෛව විවිධත්වය ක්‍රියාත්මක කිරීම සඳහා පවතින ද්විතියික හෝ විකල්ප ප්‍රවේශයක් නොව කුන්මින්-මොන්ට්‍රියල් ගෝලීය ජෛව විවිධත්ව රාමුව (KMGBF) විශ්වාසදායක සහ කල්පවත්නා ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පදනම බව අවබෝධ කරගත යුතු වේ.

ඒ අනුව, Greenpeace South Asia ශ්‍රී ලංකා රජයට ගෞරවයෙන් නිර්දේශ කරන්නේ:

- සියලුම කාර්මික, වෙරළබඩ සංවර්ධන සහ ජෛව විවිධත්ව සංරක්ෂණ ව්‍යාපෘති සම්බන්ධයෙන් ආදිවාසී ජනතාව සහ ප්‍රාදේශීය ප්‍රජාවන් සමඟ සාකච්ඡාවෙන් ඔබ්බට ගොස් අර්ථවත් සහභාගීත්වයකට මග පාදමින්, පැහැදිලිව නිර්වචනය කරන ලද නීතිමය යාන්ත්‍රණයක් හරහා

ඔවුන්ගේ නිදහස්, පූර්ව සහ දැනුවත් එකඟතාව (FPIC) අනිවාර්ය කරන ලෙස.

- පාරිසරික මානව හිමිකම් ආරක්ෂකයින්ගේ ආරක්ෂාව සහතික කිරීම සහ සාමකාමීව රැස්වීමේ අයිතිය සහ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස තහවුරු කරන ලෙස.

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 169 වැනි සම්මුතිය, ආදිවාසී ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය සහ වගකිවයුතු භූමි පාලනය පිළිබඳ ස්වේච්ඡා මාර්ගෝපදේශ ඇතුළු ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සහ ආදිවාසී ජනතාවගේ සහ ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ පූර්ණ සහභාගීත්වයෙන් යුතුව ජාතික නීති සමපාත කර පෙළගස්වන ලෙස.

මානව හිමිකම් මත පදනම් වූ ප්‍රවේශයන් දැනටමත් KM-GBF තුළ (උදහරණයක් ලෙස 22 වන ඉලක්කය) හඳුනාගෙන ඇති අතර ඒවා වහාම ක්‍රියාත්මක කළ යුතු වේ. එමනිසා, පහත සඳහන් විශේෂිත නිර්දේශ සමඟින් මානව හිමිකම් මත පදනම් වූ ප්‍රවේශයක් හරහා ජෛව විවිධත්ව හානිය මැඩපැවැත්වීම සඳහා ජෛව විවිධත්ව සම්මුතිය (CBD) සහ කුන්මින්-මොන්ට්‍රියල් ගෝලීය ජෛව විවිධත්ව රාමුව (KM-GBF) යටතේ ඇති සිය ගෝලීය වගකීම් ඉටු කරන ලෙස අපි ශ්‍රී ලංකා රජයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

- **ශක්තිමත් පාරිසරික හා සමාජීය තක්සේරු ප්‍රතිපත්ති සහ භාවිතාවන් හරහා සංවර්ධන සහ සංරක්ෂණ ක්‍රියාකාරකම් සඳහා ප්‍රජාවේ එකඟතාව තහවුරු කිරීම, සහ නිදහස්, පූර්ව සහ දැනුවත් එකඟතාව (FPIC) සඳහා පදනම ශක්තිමත් කිරීම.**

ප්‍රමුඛතාවයක් ලෙස, ආදිවාසී ජනතාවට සහ ප්‍රාදේශීය ප්‍රජාවන්ට තොරතුරු වෙත කාලීනව ප්‍රවේශවීමේ හැකියාව, තීරණ ගැනීමේ ක්‍රියාවලීන්ට සැබෑ ලෙසම සහභාගී වීමට අවස්ථා, සහ ඔවුන්ගේ ඉඩම්, ජලය, සංස්කෘතීන්, ජීවනෝපායන් සහ චාරිත්‍රානුකූල අයිතිවාසිකම්වලට සැලකිය යුතු ලෙස බලපෑ හැකි ක්‍රියාකාරකම් සඳහා එකඟතාව ලබා දීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට ඇති හැකියාව සහතික කරමින්, ප්‍රජා සහභාගීත්වය හුදෙක් සාකච්ඡාවලින් ඔබ්බට ගොස් අර්ථවත් සහභාගීත්වයක් දක්වා වර්ධනය කළ යුතුය.

- විදුලි උත්පාදන යටිතල පහසුකම් හෝ ඛනිජ කැණීම් වැනි යෝජිත සෑම සංවර්ධන ක්‍රියාකාරකමක්ම පරිසර පද්ධති මත පදනම් වූ ප්‍රවේශයක් අනුගමනය කරමින් සහ ස්වාධීන පර්යේෂණ භාවිතා කරමින්, ඒවායේ පාරිසරික, සමාජීය සහ මානව හිමිකම් බලපෑම් පුළුල් ලෙස තක්සේරු කර ඇති බව සහතික කිරීම.
- යෝජිත සියලුම සංවර්ධන සහ සංරක්ෂණ මුලපිරීම් විනිවිදභාවයෙන් යුතු, අන්තර්ග්‍රාහී සහ අනිවාර්ය සාකච්ඡා සහ එකඟතා ක්‍රියාවලීන්ට යටත් වන බවත්, ඒවා සියලුදෙනාට ප්‍රවේශ විය හැකි, සංස්කෘතික වශයෙන් උචිත සහ තීරණ ගැනීමට පෙර පවත්වනු ලබන බවත් සහතික කිරීම.
- පවතින සංවර්ධන සහ සංරක්ෂණ ව්‍යාපෘති ජාතික නීතිරාමුව, ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් සහ පාරිසරික ආරක්ෂණ විධිවිධාන සමඟ අනුකූල බව සහතික කිරීම සඳහා නැවත සමාලෝචනය කිරීම.

**ප්‍රතිපත්ති මට්ටමේ දී, ඵලදයී ප්‍රජා එකඟතාවක් සඳහා:**

- ස්වදේශික අයිතිවාසිකම් සහ ස්වභාවික සම්පත් පාලනය තුළ නිදහස්, පූර්ව සහ දැනුවත් එකඟතාව (FPIC) පිළිබඳ එප්පාවල නඩු තීන්දුවේ මූලධර්ම ඒකාබද්ධ කිරීම සඳහා ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සිදු කිරීම.
- යෝජිත සියලුම ව්‍යාපෘති පිළිබඳ තොරතුරු සඳහා ප්‍රජාවන්ට ඇති ප්‍රවේශය, සාධාරණ මහජන සාකච්ඡා ක්‍රියාවලීන් සඳහා වන කොන්දේසි සහ දැනුවත් එකඟතා නිර්ණායක, සහ අහිතකර

බලපෑම්වාට එරෙහි යුක්තිය හෝ වන්දි ලබා ගැනීමට ඇති ප්‍රවේශය සහතික කිරීම (නව ජාතික කැණීම් ප්‍රතිපත්තියේ කොටසක් ලෙසද ඇතුළුව).
- පාරිසරික මානව හිමිකම් ආරක්ෂකයින් සඳහා වැඩි ආරක්ෂාවක් ලබා දීම.

**ශ්‍රී ලංකාවේ අයිතිවාසිකම් මත පදනම් වූ සහ ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන සංරක්ෂණය සහ ස්වභාවික සම්පත් පාලනය සඳහා වන පදනම් ශක්තිමත් කිරීම.**

- ශ්‍රී ලංකාවේ ජාතික ජෛව විවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම (NBSAP) යාවත්කාලීන කරමින් පවතින බැවින්, ස්වදේශික ජනතාවගේ සහ ආශ්‍රිත ප්‍රජාවගේ අයිතිවාසිකම් මෙන්ම දයකත්වයන් පිළිබඳ KM-GBF හි නව මානව හිමිකම් පදනම් කරගත් විධිවිධාන, ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රායෝගික ක්‍රියාමාර්ග ද සමඟ එයට ඇතුළත් කර ඇති බවට සහතික කිරීම.
- ප්‍රජාව හා සම්බන්ධ වීම සහ ඔවුන්ගේ අදහස් ලබාගැනීම සඳහා ඵලදායී, සාධාරණ සහ යුක්ති සහගත යාන්ත්‍රණ සමඟින්, සංරක්ෂිත ප්‍රදේශ කළමනාකරණ සැලැස්ම වඩාත් ප්‍රායෝගික කිරීම සහ ඒවා වැඩිදියුණු කිරීම.
- ඵලදායී සංරක්ෂණය සඳහා පදනමක් ලෙස ඉඩම්, වෙරළබඩ ප්‍රදේශ සහ ස්වාභාවික සම්පත් සඳහා ප්‍රජා හිමිකාරීත්වය සහ චාරිත්‍රානුකූල අයිතිවාසිකම් හඳුනා ගන්නා සහ ආරක්ෂා කරන නීතිමය ප්‍රතිසංස්කරණ අනුගමනය කිරීම.
- විශේෂයෙන්ම ධීවර, කෘෂිකාර්මික සහ ස්වභාවධර්මය මත පදනම් වූ සංචාරක ව්‍යාපාරය තුළ, ජෛව විවිධත්ව සංරක්ෂණය සහ තිරසාර ජීවනෝපායන් එකවර ශක්තිමත් කරන ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන කළමනාකරණය සහ හවුල් කළමනාකරණ ප්‍රවේශයන් සහතික කිරීම.

**ප්‍රජා-මූලික සාගර සංරක්ෂණය නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම.**

ප්‍රාදේශීය ප්‍රජාවන්ට තීරණ ගැනීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය ලැබෙන සාගර සංරක්ෂණ මුලපිරීම් නියමු ව්‍යාපෘති ලෙස ක්‍රියාත්මක කිරීම මඟින් නායකත්වය පෙන්වීමට ශ්‍රී ලංකාවට වැදගත් අවස්ථාවක් තිබේ. ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන සංරක්ෂණය මඟින් ජෛව විවිධත්වය පුනර්ජනනය කළ හැකි අතර ප්‍රදේශවාසීන්ගේ ජීවනෝපායන්ට ප්‍රතිලාභ ලබා දිය හැකිය. දේශීයව සැලසුම් කරන ලද, කළමනාකරණය කරන ලද සහ නීතිමය පිළිගැනීමක් හෝ හවුල් කළමනාකරණ ගිවිසුම් සමඟින් නිරීක්ෂණය කරන ලද ප්‍රදේශ මඟින් සංරක්ෂණ ක්‍රියාමාර්ග ධීවර ජීවනෝපායන් සමඟ පෙළගැස්වීම, ප්‍රවේශය සම්බන්ධ ගැටුම් අවම කිරීම, අඩු වියදම් නිරීක්ෂණ සහ බලාත්මක කිරීම් (ප්‍රජා මුර සංචාර සහ සම්මතයන්) බලමුලු ගැන්වීම සහ මසුන් ඇල්ලීම තහනම් කලාප වැනි සාගර සංරක්ෂණ ක්‍රියාමාර්ග සඳහා නීත්‍යානුකූලභාවය ගොඩනැඟීම කළ හැකිය. ශ්‍රී ලංකාවේ ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන සාගර සංරක්ෂණ ක්‍රියාමාර්ග නියමු ව්‍යාපෘති ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා, ප්‍රජා තීරණ ගැනීම සහ ක්‍රියාකාරීත්වය සංරක්ෂණ ප්‍රදේශ සැලසුම් කිරීමේ සහ කළමනාකරණයේ පදනම වන බවට සහතික වීම සඳහා සාම්ප්‍රදායික හවුල් කළමනාකරණ ප්‍රවේශයන්ගෙන් ඔබ්බට යාම අවශ්‍ය වේ.

සාගර සහ වෙරළබඩ අවකාශීය සැලැස්ම (2024–2029) යටතේ විශේෂ කළමනාකරණ ප්‍රදේශ (SMAs) ලෙස හඳුනාගෙන ඇති ප්‍රදේශ ද ඇතුළුව මන්නාරම් දූපතේ සහ අනෙකුත් වෙරළබඩ ප්‍රදේශවල මෙම නියමු ව්‍යාපෘතීන් සඳහා ඇති විභවය ගවේෂණය කළ හැකිය. ඕනෑම නියමු වැඩසටහනක් අඩවි-විශේෂිත ප්‍රජා උපදේශන හරහා සංවර්ධනය කළ යුතු අතර බලපෑමට ලක් වූ ප්‍රජාවන්ගේ නිදහස්, පූර්ව සහ දැනුවත් එකඟතාව මත පදනම් විය යුතුය.

කෙසේ වෙතත්, අඩවි තේරීම, පාලන ව්‍යුහය සහ සංරක්ෂණ ක්‍රියාමාර්ග පිළිබඳ තීරණ සඳහා වැඩිදුර, අඩවි-විශේෂිත ප්‍රජා උපදේශන සහ එකඟතාව අවශ්‍ය වේ. මීට අමතරව, මෙම ප්‍රදේශවල කළමනාකරණය, ඒවායේ සැලසුම් කිරීම සහ අඛණ්ඩ පාලනය තුළ ප්‍රජා තීරණ ගැනීමේ බලය කේන්ද්‍රගත කරමින් පවතින විශේෂ කළමනාකරණ භාවිතාවන් (SMA) මත පදනම්ව වැඩිදියුණු විය යුතුය. එසේම ප්‍රජාව විසින් මෙහෙයවනු ලබන සංරක්ෂණය සඳහා වන අධීක්ෂණය සහ ඇගයීම (M&E) ද ශක්තිමත් කළ යුතු අතර මෙම ප්‍රදේශ සඳහා ජාතික අධීක්ෂණ සහ ඇගයීම් රාමුවක් සංවර්ධනය කිරීම මෙන්ම සහභාගීත්ව ක්‍රම

**Greenpeace South Asia**
6th Floor, Access Towers 1, Union Place, Col 2
www.greenpeace.org/southasia/

සම්බන්ධයෙන් ප්‍රජාවගේ ශක්‍යතා වැඩිදියුණු කිරීම සහ දේශීය ප්‍රමුඛතා නිරූපණය වන පරිදි දර්ශක සංස්කරණය කිරීම ද ඇතුළත් වේ.

මෙම ජාතික ප්‍රයත්නයන්ට සහයෝගීතාව ලබා දීම සඳහා තාක්ෂණික සාකච්ඡා, උපදේශන සහ තහවුරු කිරීමේ ක්‍රියාවලීන් හරහා නිර්මාණශීලී පාර්ශ්වකරුවෙකු ලෙස දායක වීමට ලැබෙන අවස්ථාව Greenpeace South Asia ඉතා සතුටින් පිළිගැනීමට කැමැත්තෙමු. ජාතික ජෛව විවිධත්ව උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මේ (NBSAP) සමාලෝචනයේ සහ අනෙකුත් ප්‍රදේශ පාදක සංරක්ෂණ ක්‍රියාමාර්ග (OECMs) සඳහා වන ජාතික රාමුව සංවර්ධනය කිරීමේ කොටසක් ලෙස මෙම නිර්දේශ සලකා බලන ලෙස අපි ශ්‍රී ලංකා රජයෙන් ගෞරවයෙන් ආරාධනා කර සිටින්නෙමු.

ස්තුතියි,
Greenpeace South Asia